*සැ. යු.* - (i) 2019.05.10 දින පළ වූ අංක 2,123 දරන *ගැසට් පත්‍රයේ* I :III, II, III කොටස් පළ නොවීය.
.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,124 - 2019 මැයි මස 17 වැනි සිකුරාදා - 2019.05.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1010 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1021 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1039 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජුනි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## උඩදුම්බර ප්‍රාදේශීය සභාව

උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පවත්නා පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම මෙම නිවේදනයේ සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති උඩදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *තනතුරු නාමය* :- සෞඛ්‍ය කම්කරු III (ප්‍රාථමික ශිල්පීය නොවන)

2. *පුරප්පාඩු තනතුරු ගණන* :- පුරප්පාඩු 03

3. *වැටුප් ක්‍රමය* - PL1-2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (මාසික)

4. *අධ්‍යාපන සුදුසුකම්* .- අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරක දී සමත් විය යුතුයි. (මෙහි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවල දී පරිපාටියේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් 05 ශ්‍රේණිය සමත්වීම දක්වා අඩු කර බඳවා ගැනීමට ක්‍රියාකරනු ලැබේ.)

5. *කායික සුදුසුකම්* .- සෑම අපේක්ෂකයෙක්ම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය* :

   i. අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය අනුව පවතින පුරප්පාඩුවලට පත් කරනු ලැබේ.

| *ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

   ii. සභාවේ දැනටමත් සේවයේ නියුක්ත සේවකයන් බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

7. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*:-

   i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

   ii. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

   iii. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.

   iv. ඉහත සඳහන් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

8. *පොදු සුදුසුකම්* :

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට උඩදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු බව තහවුරු කළ යුතුය.

ii. තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවකයෙකු නම් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

iii. පත්වීම් ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

iv. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු හෝ දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

v. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

vi. බඳවාගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම්, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය

vii. ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

viii. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර දී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

ix. යම් අයදුම්කරුවෙකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුවද අයථා සංග්‍රහ පැතීම හෝ එහිලා බලපෑමක් කිරීමට තැත් කිරීම එම අයදුම්කරු නුසුදුස්සකු කිරීමට හේතු වනු ඇත.

9. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :-

i. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයට අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2019.06.07 වැනි දිනට පෙර ''ලේකම්, උඩදුම්බර ප්‍රාදේශීය සභාව, උඩදුම්බර'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ii. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. *සහතිකවල පිටපත්* :

i. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතු ය. (ඡායා පිටපත් වඩා සුදුසු වේ.)

ii. උප්පැන්න සහතිකය

iii. අධ්‍යාපන සහතිකය

iv. තමාගේ පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනු අත්සන් කළ)

v. මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් (එකක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතු ය.)

vi. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්

vii. පළපුරුද්ද පිළිබඳ සහතික (ඇත්නම්)

ඩී. එම්. ආර්. එන්. දිසානායක,
ලේකම්,
උඩදුම්බර ප්‍රාදේශීය සභාව.

උඩදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.
2019 අප්‍රේල් මස 30 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**
**උඩදුම්බර ප්‍රාදේශීය සභාව**

**........................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :______________________.

    මුලකුරු වලින් හැඳින්වෙන නම :______________________.

02. ස්ථිර පදිංචි ලිපිනය :______________________.

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :______________ ප්‍රා. ලේ. :______________

04. ජාතික හැඳුනුම්පත් අංකය :______________________

05. උපන් දිනය වර්ෂය:__________ මාසය :__________ දිනය:__________

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු :__________ මාස :__________ දින :__________

07. ස්ත්‍රී/පුරුෂ භාවය :______________________

08. විවාහක/අවිවාහක බව :______________________

09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :______________________

10. අධ්‍යාපන සුදුසුකම් :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු යි.)

    අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය

    සමත් වර්ෂය:______________________ විභාග අංකය:______________________

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 01 | | 05 | |
| 02 | | 06 | |
| 03 | | 07 | |
| 04 | | 08 | |

11. (i) වෙනත් සුදුසුකම් :______________________
    (ii) වෘත්තීය සුදුසුකම්:______________________
    (iii) සේවා පළපුරුද්ද:______________________

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :
    ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග:______________________

    එම තනතුරට පත් වූ දිනය:______________________

    ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:______________________

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව පත්වීම හා ර ගනු ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි.

______________________
අයදුම්කරුගේ අත්සන.

දිනය:______________________

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන........................................................................................ මහතා/මිය/මෙනවිය මෙම ආයතනයේ............................................කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————————;
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————————;
තනතුර :——————————————;
ආයතනය :——————————————;
අත්සන :——————————————.

05-309

---

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව යන ලිපිනයට 2019.05.31 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල උපස්ථායක ( පුස්තකාල සහායක) | 03 | රා.ප.ච. 3/2016 (PL1-2016) අනුව රු. 24,250-250x10 -270x10 -300x10 -330x12- රු. 36,410 කි. මෙය 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර, එතෙක් ඉහත චක්‍රලේඛයේ උපබෙන II අනුව වැටුප හිමි වේ. | අ.පො.ස.(සා.පෙ.) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 02ක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම. |

03. *පැවරෙන කාර්යභාරය* -

- ❖ පුස්තකාල ප්‍රමිතිකරණ අනුව පොත්පත් ගබඩා කිරීම,නිකුත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පුස්තකාලයාධිපතිට සහාය වීම හා පුස්තකාලයේ පවිත්‍රතාවය පවත්වා ගැනීම.

04. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවය කරනු ලබන තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් හා ස්ථිර අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

05. වයස- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම සීමාව බල නොපැවැත්වේ)

06. *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්කරු ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 3 කට නොඅඩු කාලයක් තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ග්‍රාම නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළයුතුය)

iv. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙක් නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.

07. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

ii. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලකට දායක මුදල් ගෙවිය යුතුය.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

iv. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

08. අයදුම්පත් - අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2019.05.31 දිනට පෙර ''ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''පුස්තකාල උපස්ථායක තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

09. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

10. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී සහතික ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය

(ii) අධ්‍යාපන සහතික

(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය

(iv). මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් එවිය යුතුය)

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදන අවලංගු කිරීම ආදි සියලු බලතල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්. ඩී. ලූෂන්,<br>
ලේකම්,<br>
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 18 වැනි දින<br>
වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී

ආදර්ශ අයදුම්පත්‍රය

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

***පුස්තකාල උපස්ථායක තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග):——————————————.

   මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————.

2. තැපැල් ලිපිනය :——————————————.

3. ස්ථිර පදිංචි ලිපිනය :——————————————.

4. දුරකතන අංකය :——————————————.

5. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————

6. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :—————— මාස :—————— දින :——————

7. විවාහක / අවිවාහක බව :——————————————.

9. ජාතිය :——————————————.

10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද යන වග :——————.

11. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

12. වෘත්තීය සුදුසුකම් :——————————————.

13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :——————.

    I. දැනට දරන තනතුර :——————.

    II. එම තනතුරට පත් වූ දිනය :——————.

    III. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර / තාවකාලික /අනියම් / ආදේශක / කොන්ත්‍රාත් / ගිවිසුම්) පදනම මතද? :———

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :——————————————

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි.මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

05-215

---

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව**

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පවතින පුරප්පාඩු ගණන* | *සේවය* |
|---|---|---|---|
| 1. | රියදුරු III | 01 | මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වල රියදුරු (ප්‍රාථමික ශිල්පීය) සේවය |
| 2. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III | 01 | මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවය |

02. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරුවලට හිමි වාර්ෂික වැටුප් පරිමාණයන් පහත පරිදි වේ.

| *අනු. අංක* | *තනතුරු නාමය* | *වැටුප් කේතය* | *වැටුප් පරිමාණය* | *කාර්යක්ෂමතා කඩඉම* |
|---|---|---|---|---|
| 1. | රියදුරු III | PL3-2016 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990<br>(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 හි විධි විධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ. මෙම වැටුප් පරිමාණය පූර්ණ වශයෙන් 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.) | බඳවා ගෙන වසර තුනක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය. |
| 2. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III | PL1-2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 12 x 330 - රු. 36,410<br>(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 හි විධි විධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ. මෙම වැටුප් පරිමාණය පූර්ණ වශයෙන් 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.) | බඳවා ගෙන වසර තුනක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය. |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත අතර හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ සඳහා යටත් විය යුතුය.

ii. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට දායක මුදල් ගෙවිය යුතුය.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයට යටත්ය.

iv. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් එකී තනතුරට අදාළව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

v. සේවා ව්‍යවස්ථාවන්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි, සහ ඊට අමතරව රජය, පළාත් සභාව, පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරන නියෝගද, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද මෙම පත්වීම යටත් ය.

vi. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ බඳවා ගැනීම් වලට අදාල වන අනෙකුත් පොදු කොන්දේසි අදාල වේ.

04. *අවශ්‍ය සුදුසුකම් :*

4.01 රියදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :

*මූලික සුදුසුකම් :*

i. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න අඛණ්ඩ වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. ( පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුල නොමැති වූ විටක දී පමණක් යාබද පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ලැබේ.)

iii. අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 45 ට අඩු විය යුතුය. (රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

iv. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

v. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමකින් යුක්ත වීම.

vi. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

*අධ්‍යාපන සුදුසුකම් :*

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතුය. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

*වෘත්තීය සුදුසුකම් :*

i. තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම, බඳවා ගන්නා දිනට වසර 03 ට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

*කායික සුදුසුකම් :*

i. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.

ii. අවම උස අඩි 05 අඟල් 02 1/2 විය යුතුය.

*පළපුරුද්ද :*

1. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර තුනක පළපුරුද්ද ලබා තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් තහවුරු කළ යුතුය.)

04.02 *වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :*

*මූලික සුදුසුකම් :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න, අඛණ්ඩ වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටකදී පමණක් යාබද පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ලැබේ.)

iii. අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 45 ට අඩු විය යුතුය. (රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

iv. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

v. වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා රජයේ හෝ පෞද්ගලික ආයතනයක මාර්ග පවිත්‍ර කිරීම සහ මාර්ග නඩත්තු කිරීම සම්බන්ධයෙන් සේවා පළපුරුද්ද ලබා තිබීම පිළිබඳව විශේෂ අවධානය සම්මුඛ පරීක්ෂණයේ දී යොමු කරනු ලැබේ.

*අධ්‍යාපන සුදුසුකම් :*

i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 ට සම්මාන සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතුය. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

ii. 2015.09.22 දිනැති සේවා ව්‍යවස්ථා සංශෝධන - අංක 01 පරිදි ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පරිපාටියේ සඳහන් සුදුසුකම 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩු කර සලකා බලනු ලැබේ.

*කායික සුදුසුකම් :*

i. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.

ii. දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

05.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලුදෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ලිපි ලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් සූදානම්ව තබාගත යුතුය.

i. උප්පැන්න සහතිකයේ මුල් පිටපත,
ii. ජාතික හැඳුනුම්පත,
iii. රියදුරු තනතුර සම්බන්ධයෙන් රියදුරු බලපත්‍රය,
iv. අදාළ අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත,
v. පාසල හැරයාමේ සහතිකය,
vi. මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය,
vii. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
viii. වෘත්තීය නිපුනත්වය සනාථ කිරීමට අවශ්‍ය සහතික,
ix. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික/ලිපි.

05.2 වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු පුරප්පාඩු ගණන සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලකුණු අනුපිළිවෙළට තෝරාගෙන බඳවා ගනු ලැබේ.

05.3 රියදුරු තනතුරෙහි පුරප්පාඩු ගණන සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සපුරන සියලුම අපේක්ෂකයින් ලිඛිත පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන් වෘත්තීය පරීක්ෂණයකට යොමු කර එහි ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.

06. *අයදුම් කළ යුතු ආකාරය* :

06.1 අයදුම්කරු තනතුරු කිහිපයක් සඳහා අයදුම්කරන්නේ නම් එක් තනතුරක් සඳහා එක් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

06.2 *ගැසට්* නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක් 2019.05.31 දින හෝ ඊට පෙර '' ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.)

06.3 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ''....................................... තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

06.4 අසම්පූර්ණ හෝ නියමිත දිනය පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 240,360 හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

07. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමේ, මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලය හා මේ සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

ලේකම්,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

2019 මැයි මස 08 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ ................................ තනතුරු සඳහා අයදුම්පත

01. 1.1 මුලකුරු සමග නම :——————————————.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.

02. 2.1 ස්ථිර ලිපිනය :——————————————.

2.2 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම් කාර්යාලයීය ලිපිනය :——————————————.

03. 3.1 උපන් දිනය :——————

3.2 2019.03.31 දිනට වයස අවු :—————— මාස :—————— දින :——————

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.

05. දුරකථන අංකය :——————————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.

07. අධ්‍යාපන සුදුසුකම් :

7.1 අධ්‍යාපනය ලද පාසල :————————————

7.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය

වසර :———————————— විභාග අංකය :————————————

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

08. වෘත්තීය සුදුසුකම් :..............................................................................................................................
..............................................................................................................................

09. සේවා පළපුරුද්ද :..............................................................................................................................
..............................................................................................................................

10. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බවත්, මම දනිමි.

————————————

දිනය :———————— අයදුම්කරුගේ අත්සන.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.............................................. (ලිපිනය) හි පදිංචි.............................................. (නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී අත්සන තැබූ බවත්, සහතික කරමි.

————————————

සහතික කරන්නාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————————
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————————
තනතුර :————————
ලිපිනය :————————

12. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරුවන්.................................. (නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ....................................... (තනතුර) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරිය හැකි බවත් සහතික කරමි.

————————————

අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————————

05-564

# පළාත් පාලන නිවේදන

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විශේෂ විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කිය විය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උප ලේඛනයේ විස්තර සහිතව දක්වා ඇති මං මාවත් පහත සඳහන් පරිදි අලුතින් නම් කර ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අර්.පී.අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 25 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය - බෝයගනේ.

| පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | මාර්ගයේ වර්තමාන නාමය | මාර්ගයේ නව නාමය | වෙනත් |
|---|---|---|---|---|
| කුරුණෑගල ප්‍රාදේශීය සභාව | කුරුණෑගල | හිජ්රා මාවත | එම්.එස්.එම්.ගවුස් මාවත | ආරම්භය - නුවර ප්‍රධාන මාර්ගය ආසන්නයේ අවසානය - සිවම් ෆාරුක් මහතාගේ නිවස |

| | නම | නුවර පාරේ සිට |
|---|---|---|
| 01 | එම්.එස්.එම්.නිසාම් | වම |
| 02 | එම්.එච්.එම්.අෆ්රාජ් | දකුණ |
| 03 | එම්.ජී.එම්.ගවුස් | දකුණ |
| 04 | එම්.සාජාහන් | දකුණ |
| 05 | එම්.එච්.එම්.මාවසූක් | දකුණ |
| 06 | එම්.එම්.නලීස් | දකුණ |
| 07 | එම්.එච්.එම්.ෆාරුක් | දකුණ |
| 08 | සීනාත් සියාර් බිබී | වම |
| 09 | ජ්.එම්.එෆ්.ආස්මීර් | වම |
| 10 | එම්.එච්.එම්.අන්සාර් | දකුණ |
| 11 | එම්.එච්.එම්.ෆස්ලි | වම |
| 12 | එම්.එල්.එම්.සිදීක් | වම |
| 13 | එම්.ජී.එෆ්.ෆස්මීඩා | දකුණ |
| 14 | එම්.එන්.එම්.සල්මන් | දකුණ |
| 15 | එම්.එස්.එම්.සම්රි | වම |
| 16 | ජේ.එම්.සම්රන් | දකුණ |
| 17 | ජේ.එම්.ෆාහීර් | වම |
| 18 | එම්.ෆාහීම් | දකුණ |
| 19 | එම්.එච්.ෆවුසියා | දකුණ |
| 20 | එම්.එෆ්.එම්.ෆවාස් | වම |
| 21 | ටී.යූ.එෆ්. ෆර්ෂානා | වම |
| 22 | එම්.අයි.එම්.සවුහාර් | වම |

| | නම | නුවර පාරේ සිටි |
|---|---|---|
| 23 | එම්.එන්.එම්.රෆයිඩීන් | දකුණ |
| 24 | පී.එම්.රාසික් | දකුණ |
| 25 | කේ.එම්.ෆාරුක් | දකුණ |
| 26 | ජේ.එම්.සලීම් | දකුණ |
| 27 | එම්.එස්.එම්.නවාස් | දකුණ |
| 28 | ඒ.එම්. එම්. අසීස් | දකුණ |
| 29 | ඒ.එස්.රිස්වාන් | වම |
| 30 | එම්.අර්.එම්.අක්ෂාන් | වම |
| 31 | එම්.එෆ්.එම්.අක්රම් | දකුණ |
| 32 | එම්.ජේ.එම්.සෆීර් | වම |
| 33 | ටී.ආර්.ඩූල් | වම |
| 34 | ජේ.එම්.අෆ්සාන් | දකුණ |
| 35 | ජේ.ඉසාදීන් | දකුණ |
| 36 | එම්.එස්.අජ්මාල් | දකුණ |
| 37 | එෆ්.ඉසෙඩ්.එෆ්.රිස්නා | වම |
| 38 | එම්.සෆ්රාස් | දකුණ |
| 39 | ඒ.සී.එම්.මානාසීර් | වම |
| 40 | එම්.එස්.එම්.හාන්ෆා | වම |
| 41 | පී.කේ.එම්.රිෂාන් | වම |
| 42 | ඒ.එම්.ඉක්රම් | දකුණ |
| 43 | එෆ්.ෆයිසාන් | දකුණ |
| 44 | එම්.ඉසාදීන් | දකුණ |
| 45 | එස්.එල්.එස්.ෆයිසා | දකුණ |
| 46 | එම්.එච්.හෆිලා | දකුණ |
